**සජිත් ප්‍රේමදාස (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**சஜித் பிரேமதாச (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கை பாராளுமன்றம்

**Sajith Premadasa (M.P.)**
Leader of the Opposition - Parliament of Sri Lanka

**2025.01.16**

**<u>පුද්ගල ජීවිත ආරක්ෂා කිරීමට වහාම පියවර ගන්න.</u>**

**2025 වසර ආරම්භයත් සමඟ ගෙවුණු දින 16 තුළ පමණක් වෙඩි තැබීමේ සිදුවීම් 05 වාර්තා වීම බරපතල තත්ත්වයක් බව පළමුව අවධාරණය කරමි.**

**මෙම වෙඩි තැබීම වලින් පුද්ගලයින් 05 දෙනෙකු මියගොස්, තවත් පුද්ගලයින් 04 දෙනෙකු තුවාල ලබා ඇති අතර, මෙවැනි වාතාවරණයක් හමුවේ රටේ සිවිල් පුරවැසියන්ට නිදහසේ තම දෛනික කටයුතු කරගෙන යාමද අවිනිශ්චිත තත්ත්වයකට පත්ව තිබේ.**

**පොලිස් දෙපාර්තමේන්තු සංඛ්‍යා ලේඛණවලට අනුව විදෙස් ගතව සිටින 188 දෙනෙකුට අන්තර් ජාතික රතු නිවේදන නිකුත් කර ඇති අතර, ඉන් 63 දෙනෙකු විදෙස්ගතව සිටිමින් පාතාල කටයුතු මෙහෙයවමින්, ඝාතන, කප්පම් ගැනීම්, බියවැද්දවීම් වැනි සමාජ විරෝධී කටයුතු මෙහෙයවමින් සිටින බවත් හඳුනාගෙන තිබේ.**

**රටක පුරවැසියන්ගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම ඕනෑම රජයක මූලික කාර්යභාරය වේ. එය ආරක්ෂාව අතින් වේවා, මානව හිමිකම් පුරක්ෂිත කිරීම අනිත් වේවා, සෞඛ්‍ය අතින් වේවා, ආහාර සහ පෝෂණ අතින් වේවා, ඒ සෑම අයුරකින්ම එම වගකීම ඉටු කිරීම ඒ මොහොතේ රජය නායකත්වය දෙන ආණ්ඩුවේ කාර්යභාරය වේ.**

**අද (16) මන්නාරම උසාවි සංකීර්ණය ඉදිරිපිටදී පුද්ගලයින් දෙදෙනෙකු වෙඩි තබා ඝාතනය කිරීමේ සිදුවීමක් වාර්තා වන අතර මෙවැනි සෝචනීය සිදුවීම් නතර කිරීමට වහාම පියවර ගන්නා ලෙස විපක්ෂ නායකවරයා ලෙස මා ජනාධිපතිතුමා ප්‍රමුඛ වර්ථමාන රජයෙන් සහ සියළුම ආරක්ෂක අංශ ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමි.**

**මෙම තත්ත්වය උත්සන්න වුවහොත්, එය සාමාන්‍ය ජන ජීවිත පවත්වාගෙන යාමට සහ ජනතාවට නිදහසේ කටයුතු කිරීමට ඇති ඉඩකඩ ඇහිරීමට හේතුවක් වනු ඇති බව මාගේ අදහසයි.**

**ඒ නිසා කඩිනමින් මෙම පාතාල ක්‍රියාකාරකම් මර්ධනය කිරීමටත්, විදේගතව සිටිමින් මේවා මෙහෙයවන පිරිස් නීතිය හමුවට ගෙන ඒමටත් කටයුතු කරන ලෙස ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිමි.**

**රටේ විපක්ෂයට නායකත්වය දෙන පුද්ගලයා ලෙස මමත්, මාගේ විපක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායමත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට සූදානම් බව අවධාරණය කරනු කැමැත්තෙමි.**

**ස්තුතියි,**

**සජිත් ප්‍රේමදාස**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක.**

දුරකතන : தொலைபேசி : Telephone : 011 2 777 253 / 011 2 699 171
ෆැක්ස් : தொலைநகல் : Fax : 011 2 699 174
විද්‍යුත් තැපෑල : மின்னஞ்சல் : Email : sajith_p@dialogsl.net

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7
இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7
No 30, Sir Marcus Fernando Mawatha Colombo 7